

දේවානම්පියතිස්ස රජතුමා කරවන ලද ථූපාරාම චෛත්‍යරාජයාණන් වහන්සේ

## ※ බුදුදහමෙහි ඉගැන්වෙන නාම - රූප සංකල්පය

– පහළගම ධම්මික හිමි

සත්වයාගේ යථාස්වභාවය සහ සසර පැවැත්ම සිදුවන අයුරු පහදදීම සඳහා බුදුරදුන් විසින් සත්වයා පිළිබඳ නාම – රූප වශයෙන් ඉදිරිපත් කර ඇති විශ්ලේෂණයට අර්ථකථනයකි.

## ※ සසර සයුර තරණයට මඟපෙන්වන චන්දන සූත්‍රය

– ගම්පොළ ඤාණසීහ හිමි

‘සසර’ නමින් බුදු දහමෙහි හැඳින්වෙන සත්වයාගේ පුළුල් ජීවිත ගමන ඉක්මවා නිවන් සුව ලැබීම සඳහා අවශ්‍ය පිළිවෙත් මඟ පැහැදිලි කැරෙන – සංයුත්ත නිකාය නම් වූ ත්‍රිපිටක ග්‍රන්ථයේ දේවතා සංයුත්තයට අයත් සූත්‍ර ධර්මයකට අර්ථ විවරණයකි.

## ※ චතු සච්ච පබ්බ (පරිග්ගහ) භාවනාව

– මහාචාර්ය උතුරාවල ධම්මරතන හිමි

‘සතර සතිපට්ඨාන භාවනා’ නම් වූ සුප්‍රකට බෞද්ධ විදර්ශනා භාවනාව විග්‍රහ කරන ලිපි පෙළක තවත් ලිපියකි. බුදුදහම ඉදිරිපත් කරන ප්‍රධාන ඉගැන්වීම වූ ආර්ය සත්‍ය සතර පිළිබඳ අවබෝධය ලැබීම මෙම භවනාවෙන් සිදුවේ.

## ※ සදහම් දැනුම

– වහුමුවේ විජයවංස නා හිමි

බුදුදහම හා ඒ ආශ්‍රිත විවිධ විෂය කරුණු පිළිබඳ කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් විශේෂාංගයක තවත් එක් කොටසක්. දහම හදාරන සිසුන්ට මෙම විශේෂාංගය විශේෂයෙන් ප්‍රයෝජනවත් විය හැකිය.

## ※ ඇයි? මේ තරම් නිගරුව බුදුරුවට

– කතුවැකිය

## ※ බෞද්ධ කැටයම් කලාවේවිශිෂ්ටත්වය පිළිබිඹු කරන සඳකඩ පහණ

– නිර්මලා අමරසිංහ

ශ්‍රී ලංකාවේ බෞද්ධ කැටයම් කලාවේ සුවිශේෂ නිර්මාණයක් ලෙස සැලකෙන සඳකඩ පහණේ කලාත්මක හා දර්ශනික අගය ද – එහි ඉතිහාස කතාව ද විමසුමට ලක් කැරෙන ලිපියකි.

## ※ අඩුවෙන් කතා කොට වැඩියෙන් සේවය කළ රඹුක්-වැල්ලේ ශ්‍රී විපස්සි මහ නා හිමිපාණෝ

– දිවියාගහ සයස්සි නා හිමි

ශ්‍යාමෝපාලි වංශික මහා නිකායේ මල්වතු පාර්ශ්වයේ මහානායක හිමියන් වශයෙන් වැඩ සිට පසුගිය (ජූනි) එකොළොස් වැනිද අපත් වී වදළ සුප්‍රකට මහ තෙර නමකගේ ජීවන තොරතුරු හා ශාසනික සේවා පිළිබඳ විස්තර ඇතුළත් ලිපියකි.

## ※ බුදුහිමියන් අනුදැන වදාළ කායික හා මානසික රෝග ප්‍රතිකාර

– පොත්තේවෙල බුද්ධරක්ඛිත හිමි

වැදගත් සෞඛ්‍යෝපදේශ රැසක් ඇතුළත් සූත්‍ර දේශනා කිහිපයක් පිළිබඳ විමර්ශනයකි. යහපත් සෞඛ්‍ය තත්ත්වයක් පවත්වා ගැනීමට අදාළ පිළිවෙත් සහ විවිධ රෝගාබාධවලට බුදුරදුන් නිර්දේශ කළ ප්‍රතිකාර ක්‍රම පිළිබඳ විමසුමකි.

## ※ ධම්ම චින්තා යොවුන් ආදරය

– කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි

ආදරයට, ප්‍රේමයට නැඹුරුවන යොවුන් දරු දැරියන්ට දැහැමි ඔවදනක් ලෙස මෙම කුඩා ලිපිය හැඳින්විය හැකිය. ‘ධම්ම චින්තා’ නම් වූ විශේෂාංගය යටතේ මෙම ලිපිය පළවේ.

## ෴ බමුණු ඇදුරන්ගේ මනෝ යථාර්ථය බිඳ දැමූ බෞද්ධ චින්තනය

– රෙජී වීරමන්

බුද්ධ කාලීන භාරතයේ බමුණු ඇදුරන් තුළ තිබූ ආගමික චින්තනය සහ ඔවුන් විසින් එවකට බිහිකරනු ලැබ තිබූ වැරැදි ආකල්ප සහිත සමාජ පසුබිම ද, බෞද්ධ චින්තනය නිසා එම සමාජ පසුබිම වෙනස් වූ අයුරු ද පිළිබඳ සිදුකැරෙන විග්‍රහයකි.

## ෴ තමාට තමා ද්‍රෝහි වීමේ ආදීනව

– දිවියාගහ යසස්සි නා හිමි

පින් හා පව් වශයෙන් සරල ලෙස දහම තුළ බෙද දැක්වෙන – චේතනා මූල්කොට ගෙන සිදුකැරෙන – කර්ම ශක්තියක් හට–ගන්නා ක්‍රියා විෂයෙහි පුද්ගලයා කොතරම් අවධානයක් දැක්විය යුතු ද යන්න උපමා කතා කිහිපයක් ඇසුරෙන් පැහැදිලි කැරෙන කුඩා ලිපියකි. ‘සාර්ථක ජීවිතයකට ධම්මපදයෙන්’ විශේෂාංගය යටතේ මෙම ලිපිය පළවේ.

## ෴ මිරිස්සේ ධම්මික හිම

සුවිශාල ශාසනික සේවයක් සිදුකොට ඇති සුප්‍රකට – වියත් හිමි–වරුන් දෙනමක් පිළිබඳ තොරතුරු – මෙම ලිපි මගින් හෙළි කැරේ.

## ෴ පෙතන්ගොඩ ශ්‍රී රාජසිංහාරාමය

– කේ. ඒ. දුමින්ද කාරියවසම්

කැගල්ල දිස්ත්‍රික්කයට අයත් පෙතන්ගොඩ නමැති ප්‍රදේශයේ පිහිටි අලංකාර බෞද්ධ චිත්‍ර හා කැටයම් සහිත තරමක් පැරැණි විහා–රස්ථානයක් පිළිබඳ තොරතුරු මෙම ලිපියෙන් හෙළි කැරේ. කැගල්ල – අවිස්සාවේල්ල මාර්ගයේ අඟුරුවැල්ල නගරයෙන් ඉඹු–ලාන මාර්ගයට හැරී සැතපුම් කිහිපයක් ගිය විට පෙතන්ගොඩ ග්‍රාමය හමුවන බව ලේඛකයා පවසයි.

## ෴ ශ්‍රී මහා බෝධියේ ප්‍රභවය ලාංකීය සමාජය කෙරේ බලපෑ අයුරු

ලේක්හවුස් මිහින්තලා ආලෝක පූජා උළෙල නිමිත්තෙන් බුදුසරණ – දිනමිණ පත්‍රවල අනුග්‍රහයෙන් පැවති දීපව්‍යාප්ත රචනා තරග–යෙන් ප්‍රථම ස්ථානය දිනූ වයි. උදිතා ප්‍රියදර්ශනී පෙරේරා ශිෂ්‍යා–වගේ රචනාව.

## ෴ Pancayudha Jatakaya

*-by Dr. S.G. Samarasinghe Of Samskrti Research e-mail samskriti@sltnet.lk*